museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 මාර්තු

**මිනෙට් ද සිල්වා: සීමා පවුරු බිඳලූ වාස්තු විද්‍යාඥවරිය**

ඉතිහාසයේ පටන් පිරිමි විසින් ආධිපත්‍යය දැරූ ක්ෂේත්‍රයක පුරෝගාමියෙක් ලෙස නැගී සිටින මිනෙට් ද සිල්වාගේ (1918–1998) බලපෑම වාස්තු විද්‍යාත්මක නිර්මාණ සැලසුම්කරණයේ පමණක් නොව, ලිවීම්, ඉගැන්වීම් මෙන් ම විද්වත් නියැලීම් තුළත් අදටත් ප්‍රතිරාවය දෙයි. ශ්‍රී ලංකාවේ ප්‍රථම වාස්තු විද්‍යාඥවරිය ලෙස සැලකෙන ද සිල්වා, 1948 මහනුවර Studio of Modern Architecture නම් තමන්ගේ ම වාස්තු විද්‍යා ව්‍යවහාරයක් පිහිටුවීමෙන් සම්ප්‍රදායන් බිඳ හෙලුවා ය. ඇය, තමන්ගේ ම වාස්තු විද්‍යා ව්‍යවහාරයක් පිහිටුවූ ලෝකයේ පළමු වාස්තු විද්‍යාඥවරියන්ගෙන් කෙනෙකු වේ. විශේෂයෙන් ම, ද සිල්වා 1948දී  බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාඥයින්ගේ රාජකීය ආයතනයේ (RIBA) ආශ්‍රිතයෙකු ලෙස තේරී පත්වූ ප්‍රථම ආසියාතික කාන්තාව වන අතර, වාස්තු විද්‍යාවට ඇය ලබාදුන් කැපී පෙනෙන දායකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (SLIA) 1996දී ඇයට රන් සම්මානය පිරිනැමුවේ ය.

ද සිල්වාගේ වාස්තු විද්‍යාත්මක ඌරුව නූතන නිර්මාණ සැලසුම්කරණ මූලධර්ම සහ සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සෞන්දර්යයන්වල සුවිශේෂ සංයෝගයක් විය. සරල බව, කාර්යාත්මකතාව, හා දේශීය සංස්කෘතිය කෙරෙහි ගැඹුරු ගෞරවයක් තැබූ ඇය, ඒ ඒ පරිසර සමඟ සහයෝගීව අනුකලනය වන ශ්‍රී ලාංකික ශිල්ප ක්‍රමවලින් අභාසය ලැබුවා ය.

හැක කෙනෙක්ට ම හොඳින් සැලසුම් කළ හා ජීවත්විය හැකි නිවසක් තිබීමේ වැදගත්කම අවධාරණය කළ ද සිල්වා, වාස්තු විද්‍යාත්මක ප්‍රයත්න හරහා දැරිය හැකි මිලකට නවාතැන් පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් පෙනී සිටියා ය. ඇය සමාජ වගකීම පිලිබඳ දැක්වූ කැපවීම ඇගේ නිර්මාණ කටයුතුවලට ද පැතිරුනු අතර, ජීවන තත්ත්වය ඉහළ නැංවීමට වාස්තු විද්‍යාවට ඇති හැකියාව පිළිබඳ ඇය තුළ තිබූ ගැඹුරු විශ්වාසය එහි ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) 2024 ජූලි 7 දක්වා සංදර්ශිත 'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' ප්‍රදර්ශනය, බහුවිධ රාජ්‍ය සේවකයින් ප්‍රජාවකට දැරිය හැකි මිලකට නවාතැන් පහසුකම් සපයා දීමේ ඇයගේ දූරදර්ශී ප්‍රවේශය පිළිබඳව අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාවේ සමාජ සවිඥානක වාස්තු විද්‍යාවේ පුරෝගාමියෙකු ලෙස ඇයව ස්ථානගත කරයි.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org